# සඞ්කතයන්ගේ සඞ්කත ලක්ෂණ තුනකි
# අසඞ්කතයේ අසඞ්කත ලක්ෂණ තුනකි
## චූල වර්ගය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1 - පිටු අංක 274 - 275)

සඞ්කතයන්ගේ (හේතූන් නිසා හටගත් දෙයෙහි) ලක්ෂණ තුනකි.

1. ඉපදීම පෙනෙයි (ප්‍රකට වෙයි ).
2. වය (විනාශය) පෙනෙයි.
3. පවතින්නහුගේ වෙනස් වීම (ජරාව) පෙනෙයි.

මේ සඞ්කතයාගේ සඞ්කත ලක්ෂණ තුනයි.

අසඞ්කතයේ ( නිවනේ ) ලක්ෂණ තුනකි.

1. ඉපදීම නොපෙනෙයි.
2. විනාශය නොපෙනෙයි.
3. ජරාව නොපෙනෙයි.

මේ අසඞ්කතයේ අසඞ්කත ලක්ෂණ තුනයි.